රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
அரசாங்க சேவைகள், மாகாணசபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Services, Provincial Council and Local Government

# රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
# அரசகரும மொழிகள் திணைக்களம்
# Department of Official Languages

341/7, කෝට්ටේ පාර, රාජගිරිය. 341/7, கோட்டே வீதி, இராஜகிரிய. 341/7, Kotte Road, Rajagiriya.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. — DOL/LAB/LPC/2020 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date — 2020.11. |

**අමාත්‍යාංශ ලේකම්වරුන්**

**පළාත් ප්‍රධාන ලේකම්වරුන්**

**දෙපාර්තමේන්තු ප්‍රධානීන්**

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව රාජ්‍ය නිලධාරින් විසින් අත්කර ගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාව</u>**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ පහසුකම් සැලසීමේ ප්‍රමුඛ ආයතනය වන රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මේ වන විටත් ඉහත චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය/ පළාත් රාජ්‍ය නිලධාරින් සඳහා භාෂා පාඨමාලා පැවැත්වීමේ කටයුතු ආරම්භ කර ඇත.

02. ඒ අනුව ඔබ ආයතනයේ නිලධාරින් සඳහා භාෂා පාඨමාලා සංවිධානය කිරීමට අදහස් කරන්නේ නම් මේ සමඟ අමුණා ඇති ආකෘතියට අනුව කඩිනමින් ඉල්ලුම් කරන මෙන් කාරුණිකව දන්වමි.

03. <u>පාඨමාලා කොන්දේසි</u>

- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව එක් සේවා මට්ටමකට අදාළ කණ්ඩායමක් සඳහා අපේක්ෂකයන් 30 – 50 ත් අතර සිටිය යුතුය.
- එක් කණ්ඩායමක් සඳහා ප්‍රමාණවත් පිරිසක් අදාළ ආයතනයන් හි නොමැති නම් වෙනත් ආයතනයක් සමඟ සම්බන්ධ වී නිලධාරින් සම්බන්ධ කොට ගෙන මෙම පාඨමාලාව සංවිධානය කළ හැකිය.
- පාඨමාලාව කඩිනමින් නිම කිරීමේ අවශ්‍යතාව මත පාඨමාලාව පැවැත්වෙන දින ගණන (අදාළ පැය ගණන ආවරණය වන පරිදි) දෙපාර්තමේන්තු ප්‍රධානියාට තීරණය කළ හැකිය.
- සතියේ දින හෝ සති අන්ත දින ආයතන ප්‍රධානියාගේ අභිමතය පරිදි මේ සඳහා යොදා ගත හැකි අතර දිනකට පන්ති පැවැත්වෙන කාලය අනිවාර්යයෙන්ම පැය 06 ක් හෝ ඊට වැඩි විය යුතුය.
- සම්පත්දායකයන් යොමු කිරීම සහ සහතික පත්‍ර ලබා දීම රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලැබේ.

- නිලධාරින්ගේ පැමිණීමේ වාර්තා පාඨමාලාව මෙහෙයවන සම්පත්දායකයන් විසින් ද සම්පත්දායකයන්ගේ පැමිණීම හා පිටවීම පිළිබඳ වාර්තාවන් අදාළ ආයතනය විසින් ද ලබා ගත යුතු අතර මෙම වාර්තා විධිමත් පරිදි රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

- පාඨමාලාවේ සියලු අධීක්ෂණ කටයුතු රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

- මෙම පාඨමාලාව සඳහා අයදුම්කරුවන්ට පෞද්ගලිකව ඉල්ලීම් කළ නොහැකි අතර මේ සමඟ අමුණා ඇති A හා B ආකෘති පත්‍ර සම්පූර්ණ කොට ආයතන ප්‍රධානියා විසින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

- එක් එක් සේවා මට්ටම සඳහා වෙන වෙනම ආකෘති ඉදිරිපත් කළ යුතු අතර නියමිත පරිදි සම්පූර්ණ කරන ලද A හා B ආකෘති පත්‍ර **" රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 341/7, කෝට්ටේ පාර, රාජගිරිය"** යන ලිපිනයට එවිය හැකි අතර එසේ නැතිනම් එම ආකෘති පත්‍ර පරිලෝකනය කොට (Scan) official.langcourse@gmail.com යන විද්‍යුත්ලිපිනයට යොමු කළ හැකිය. (කවරයේ වම්පස ඉහළ කෙළවරේ " රාජ්‍ය භාෂා පුහුණු පාඨමාලා " යනුවෙන් සඳහන් කරන්න)

***රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ඉලක්ක කොට ගත් මෙම භාෂා පාඨමාලාවන් හි වගකීම රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හා ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය මඟින් දරන අතර වෙනත් කිසිදු රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයකට මෙහි බලය පිරිනමා නැති බව කාරුණිකව දන්වමි.***



**ප්‍රින්ස් සේනාධීර**

රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| පොදු<br>பொது<br>General | 2888934<br>2865478 | කොමසාරිස්ජනරාල්<br>ஆணையாளர் நாயகம்<br>Commissioner General | 2888929 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 2888928 | ප්‍රධාන ගණකාධිකාරි<br>பிரதமகணக்காளர்<br>Chief Accountant | 2888930 | කොමසාරිස්<br>ஆணையாளர்<br>Commissioner | 2865370 |

ඊමේල්/ மின்னஞ்சல்/ E-mail – *languages.dept.ad04@gmail.com*වෙබ්අඩවිය/ இணையதளம்/ Web Site – *www.languagesdept.gov.lk*